# වැහැපන් වැස්ස

ත්‍රිපිටකවේදී උපාධි අපේක්ෂක,

**කඩවලගෙදර ධම්මසේන හිමි**

ධනිය : බත් පික උයා ඇත කිරි පික දෙවා — ඇත
ගන්තෙර උස් බිමක ගේ දෙර සදා — ඇත
හොඳ හැටි සෙවිලි කළ ගෙයි ගිනි ගොඩ ද — ඇත
වැහැපන් වැස්ස! වහිනට නම් තුඹේ — සිත

බුදුනු : පැසවුම් කිසිත් නැත කණු කටු කොහෙත් — නැත
ගන්තෙර රැයක් ගත කෙරුමට පැමිණ — ඇත
කුටියත් වසා නැත ගිනි ගොඩ නිවා — ඇත
වැහැපන් වැස්ස! වහිනට නම් තුඹේ — සිත

ධනිය : මැස්සන් මදුරුවන් දක්නට කොහෙත් — නැත
ගන්තෙර අලුත් තණ ගවයන් බුදිනු — ඇත
කෙතරම් වැස්ස් ආවත් දුන් බියක් — නැත
වැහැපන් වැස්ස! වහිනට නම් තුඹේ — සිත

බුදුනු : බැන්දෙමි පහුර කොහොමටවත් කැඩෙනු — නැත
ඉන් සැඩ පහරවල් ජයගෙන පැමිණ — ඇත
නැවතත් පහුරකින් මට ඇති පලක් — නැත
වැහැපන් වැස්ස! වහිනට නම් තුඹේ — සිත

ධනිය : මට විශ්වාස කීකරු බිරියක් ද — ඇත
මෙතුවක් කලක් ඇසුරෙන් සිත දිනා — ඇත
සැක කටයුතු කිසිත් ඈ ගැන අසා — නැත
වැහැපන් වැස්ස! වහිනට නම් තුඹේ — සිත

බුදුනු : මා සිත කීකරුය එහෙ මෙහෙ බැඳී — නැත
දිගු කල් වැසීමෙන් හොඳහැටි දැමී — ඇත
තවමත් කිසිම වරදක් මගෙ පෙනී — නැත
වැහැපන් වැස්ස! වහිනට නම් තුඹේ — සිත

ධනිය : නිවහල් මගේ රැකියාව ද කෙරී — ඇත
මෙතැනම මගේ දරු පිරිස ද සුවෙන් — ඇත
මෙතුවක් ඔවුන්ගේ වරදක් අසා — නැත
වැහැපන් වැස්ස! වහිනට නම් තුඹේ — සිත

බුදුනු : කිසිදින මගෙන් රැකියාවක් කෙරී — නැත
ලොව සැරිසැරීමට බාදාවකුත් — නැත
දනයෙන් වැඩවලින් මට කිසි පලක් — නැත
වැහැපන් වැස්ස! වහිනට නම් තුඹේ — සිත

ධනිය : මගෙ ගව රැළෙහි නායක ගවයන් ද — ඇත
කිරි දෙන දෙනුන් හා ගැබ්බර දෙනුන් — ඇත
මහළු, තරුණ හා පොඩි පැටවුන් ද — ඇත
වැහැපන් වැස්ස! වහිනට නම් තුඹේ — සිත

බුදුනු : කිරි දෙන දෙනුන් හෝ කිරි බොන පැටව් නැත
එහෙ මෙහෙ දුවන - නිති විසිරුණු රළක් නැත
නායක ගොනුන් හෝ ගැබ්බර දෙනුන් නැත
වැහැපන් වැස්ස! වහිනට නම් තුබේ සිත

ධනිය : ගවයන් බැඳුන කණු හොඳහැටි සවිය ඇත
අලුතින් හොඳට ඇඹරූ කඹ යොදූ ඇත
කෙතරම් දඟලුවත් ඒවා කැඩෙනු නැත
වැහැපන් වැස්ස! වහිනට නම් තුබේ සිත

බුදුනු : මා බැඳි සියලු කණු උදුරා දමා ඇත
මොන යදමකින් හෝ නැවතත් බැඳෙනු නැත
දූත් නිදහස්ය යළි ගාලට නොඑනු ඇත
වැහැපන් වැස්ස! වහිනට නම් තුබේ සිත

(ධනිය ගෝපාල සූත්‍රය ඇසුරෙනි)

කමරමු කමරදු - කමු අණුවිචිද'ඕ
කමු අණුස්වරො හිඛු - සධර්ම පරිහයදි

කර්මයෙහි බැඳුණා වූ කර්මයෙහි ඇළුණා වූ, කර්මය ගැන ම සිතන්නා වූ, කර්මය ම සිහිකරන්නා වූ භික්‍ෂුව සද්ධර්මය පිරිහීමට පමුණුවයි.

(ගාන්ධාරී ධර්මපද, භික්‍ෂු වර්ග, 13)

මකෂි'අ මත්සරි හොදි - පුහත හොදි ගධවො
කොධණො සු'අරො හොදි - ම යෙ කුජු කුමරක

මසුරා මීමැස්සෙකු වී උපදියි, පහර දෙන්නා බූරුවෙකු වී උපදියි, ක්‍රොධ කරන්නා ඌරෙකු වී උපදියි. දරුව, ක්‍රොධ නො කරන්න.

(ගාන්ධාරී ධර්මපද, ක්‍රොධ වර්ග, 285)



9. මු.ස. 861064